**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය - 2024**
**(කලාප මට්ටමේ ලිඛිත තරග)**

1. අපේක්ෂකයාගේ නම : ............................................................
(මුල'කුරු සමඟ නිවැරදිව ලියන්න.)
2. විදුහලේ නම සහ ලිපිනය : ............................................................
3. පාසල් වර්ගය (200 තෙක්/ 201 - 500 තෙක් / 500 ට වැඩි) ..............................
4. කලාපය : ..............................
5. පළාත : ..............................

| **6 ශ්‍රේණිය** | **පද්‍ය නිර්මාණ හා අවබෝධය** | **කාලය පැය 02** |
|---|---|---|

- I කොටසට **අයත් ප්‍රශ්න සියල්ලට ම** පිළිතුරු සපයන්න.
- II කොටයෙහි (අ), (ආ) යන කොටස්වල ඇතුළත් ප්‍රශ්න අතරින් **එක් ප්‍රශ්නයකට පමණක්** පිළිතුරු සපයන්න.

## I කොටස

(01) ''තෙල් ගාලා හිස පීරන් නැනෝ'' යන වැකිය **පද මාරු කරමින්** අර්ථයට බාධා නොවන සේ පහත දැක්වෙන අයුරින් ලිවිය හැක.

උදා: තෙල් ගාලා හිස පීරන් නැනෝ
ගාලා තෙල් පීරන් හිස නැනෝ
නැනෝ පීරන් තෙල් ගාලා හිස
ගාලා තෙල් නැනෝ හිස පීරන්

මෙය ආදර්ශයට ගෙන පහත වාක්‍ය අර්ථයට බාධා නොවන සේ **පද හතර මාරු කරමින්** ලියන්න.

i. අන්දා ඔබගෙ සිතියම හද මිණි බැම්මේ
ii. පුත, බලන් ඔබ පෙම්බර මැණියෝ
iii. කැලේ තිබෙන කොයි දේවත් රස වේවා.
iv. බඩගිනි නිවූ අම්මා ඔබ ය
v. රන් එතනා ඉපනැල්ලේ මොනවද අහුලන්නේ
vi. මුනිඳුන් වැඳ රජ කී මේ ලෙසටා
vii. මව්පියන් උතුම් කොට සලකන්න.
viii. පමා නොවී එම් අකුරට මෙයින් මතු
ix. මේ අපේ උදාර වූ මාතෘ භූමියයි
x. අත දෙන්නම් තාත්තේ වන්දි ගෙවන්න.

(ලකුණු 1 X 10 = 10)

(02) පහත දැක්වෙන කවිවල ඉතිරි පද සම්පූර්ණ කරන්න

i. උදෑසනම නැගිටලා
දත් මැද මුව සෝදලා
..............................................................
..............................................................

ii. වලාකුළෙන් බැස එනවා
..........................................................................
..........................................................................
ගං ඇළ දොළ පුරවනවා

iii. කතා කියා දී මා රැක බලාගෙන
අන්දා හැඩට දැතට මා වඩාගෙන
..........................................................................
..........................................................................

iv. ..........................................................................
..........................................................................
පොත් මිටිය ද පැන්සලය ද දැතට ගන්නේ
උදෑසනම මා පාසල වෙතට ඇදෙන්නේ

v. ..........................................................................
හිමිදිරියේ මල් සුවඳින් ලොව නැහැ වෙන්නේ
කුරුලු පැටවු කිචි බිචි ගා නද පතුරන්නේ
..........................................................................

(ලකුණු 1 X 5 = 5)

(03) පහත පැදි පෙළ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) තුඩින් මල් පැණි ඇද බොතී
ටිකෙන් ටික බී රඟ දෙතී
ගසින් ගසකට දිව යතී
මලින් මලකට පැන යතී

(ii) කිසි විටක අලසව නැතී
මුළු දවස නිති වෙහෙසෙතී
නරන් මෙන් ගැටුමක් නැතී
එකා මෙන් සැම වැජඹෙතී

(iii) එක එකා ගොස් එක වගේ
රැස් කරන පැණි තුඩු අගේ
එකතු වන සැටි හරි අගේ
එතැන රජදහනක් වගේ

i. මෙහි කියවෙන්නේ කුමන සත්ත්ව කොට්ඨාසයක් පිළිබඳව ද?
..........................................................................

ii. මිනිසා හැඳින්වීම සඳහා මෙහි යොදා ගෙන ඇති වචනය කුමක් ද? ..............................

iii. මෙහි සඳහන් උපමාවක් තෝරා ලියන්න. ..........................................................................

iv. මිනිස් සමාජයට මේ සත්ත්වයින්ගෙන් ගත හැකි ආදර්ශයක් ලියන්න.

.................................................................................................................................................

v. පහත සඳහන් පදවලට සමාන පද ලියන්න

අලසව - ........................................................................

නිති - ........................................................................

(ලකුණු 1 X 5 = 5)

(04) දී ඇති නිදසුන සැලකිල්ලට ගෙන එළිසම වචන යොදා ඉදිරියේ ඇති හිස් කොටු සම්පූර්ණ කරන්න.

| උදා: වැන්දා | බැන්දා | ඇන්දා |
|---|---|---|
| යන්නේ | | |
| බලාපන් | | |
| වෙන්ට | | |
| නටයි | | |
| කරද්දී | | |

(05) (අ) පහත කවියේ අදහස ඔබේ වචනයෙන් ලියන්න.

(ලකුණු ½ X 10 = 5)

කඳ කුමරිඳු ලෙසි න
බමුණු පැටියන් සමගි න
නොමද සව් ඉසුරෙ න
වැඩිණි නව සඳ මෙන් දිනෙන් දින

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

(ලකුණු 2)

(ආ) පහත සඳහන් වචනවල අර්ථ ලියන්න.

i. පිවිතුරු - ........................................................................

ii. දිනිඳු - ........................................................................

iii. සියලඟ - ........................................................................

(ලකුණු 1 X 3 = 3)

(06) පහත සඳහන් කවි පැනවලට කවියෙන් පිළිතුරු ලියන්න.

i. උදෑසනම නැග එන්නේ
දසත එළිය විහිදන්නේ
හිරු කිරණින් පිබිදෙන්නේ
මේ සැම කොතැනින් එන්නේ?

පිළිතුර : ........................................................................................................

........................................................................................................

........................................................................................................

........................................................................................................

ii. දඟ වැඩ කෙරුමට නිතරම හිත යොමු කරන
පාසල් යන්නට අලසව බොරුවක් කියන
ළමයින් ඇත පොත් පත් ගෙන අකුරු - නොකරන
කළ යුතු දේ කුමක් ද හොඳ ළමයෙකු වෙන්න?

පිළිතුර ඃ ..............................................................................................................
..............................................................................................................

iii. අසරණ කෙනෙකු නැග ගත්තොත් බස්රියට
ඉවත බලා සිටින්නෙ ඇයි නොදැනෙන්ට?

පිළිතුර ඃ ..............................................................................................................
..............................................................................................................

iv. උපන් බිමට ණය නැති
රණ විරු එඩිතර ගති
දරුවෙකු වන්නට නිති
හැක්කේ කෙලෙස ද සිති

පිළිතුර ඃ ..............................................................................................................
..............................................................................................................
..............................................................................................................
..............................................................................................................

v. කලක පටන් හිත තෙරපෙන කරුණක් තියෙනව අහන්න
නීති රීති උපදෙස් දුන්නත් හැමවිට පිළිපදින්න
වටිනා ජීවිත අහිමි ව කාටත් වෙයි දරාගන්න
මහමග අනතුරු වැඩි ඇයි කියලා බැහැ නිම කරන්න?

පිළිතුර ඃ ..............................................................................................................
..............................................................................................................
..............................................................................................................
..............................................................................................................

(ලකුණු 2 X 5 = 10)